# පොදු අවකාශවල ලිංගික අතවර සිදුවීම පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක් (පොදු ප්‍රවාහන සේවාව ඇසුරින්)

ඩබ්.ඩී.අයි.පී. විජේසිංහ - සමාජවිද්‍යා අධ්‍යයනාංශය

පොදු අවකාශය තුළ කාන්තාවන්ට එරෙහි හිංසනය ලොව පුරා බරපතළ ගැටලුවකි. කාන්තාවන් ගෘහස්ථ ක්ෂේත්‍රයට පමණක් සීමා වූ ජීවිතවලින් ඔබ්බට ගමන් කරන විට ඔවුන්ගේ අවකාශමය සචලතාව එක්තරා ආකාරයක අපගමනයකි. පොදු ප්‍රවාහන සේවාව තුළ කාන්තාවන් අතවරයට ලක්වීම සිදුවනේ කෙසේ ද යන්න මෙහිදී අධ්‍යයනය කරනු ලැබේ. මෙහි දී කොළඹ දිස්ත්‍රික්කයෙහි පිහිටි කොළඹ විශ්වවිද්‍යාලය පර්යේෂණ ක්ෂේත්‍රය සම්භාවිතාවක් නොවන අභිලාෂී නියැදි ක්‍රමය භාවිතයෙන් එදිනෙදා ගමනාගමන කටයුතු සඳහා පොදු ප්‍රවාහන සේවාව භාවිත කරන අවුරුදු 20 ඉක්මවූ කාන්තාවන් 15 දෙනෙකු නියදිය සඳහා තෝරා ගනු ලැබීය. මෙය ගුණාත්මක පර්යේෂණයක් බැවින් දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් කාන්තාවගේ අත්දැකීම අර්ථකථනය කිරීමට ප්‍රශ්නාවලිය ලබාදෙන අතරම සමීක්ෂණ ක්‍රමයෙන් මූලික දත්ත රැස් කිරීම සිදු කර ඇත. මෙහිදී කාන්තාවන් පොදු ප්‍රවාහන සේවාව තුළ අතවරයට ලක්වන විවිධ ස්වරූප, කාන්තාවන් අතවර සිදුවන අවස්ථාවේදී ඒ සඳහා දක්වන ප්‍රතිචාර හා අතවර කරන පුද්ගලයන්ගේ හැසිරීම ආදී අංශ කෙරෙහි විශේෂ අවධානයට ලක් කරමින් අරමුණු ප්‍රධාන හඳුනාගත් තේමා මගින් විශ්ලේෂණය සිදු කර තිබේ. මේ අනුව මෙම අධ්‍යයනයෙන් කාන්තාවන් පොදු ප්‍රවාහන සේවාව තුළ ලිංගික අතවරයට ලක්වන ප්‍රධාන ආකාරයන් 09ක් හඳුනා ගත් අතරම කාන්තාවන්ට පොදු අවකාශය තුළ අතවර සිදුවීම සඳහා එම අවකාශයෙහි සැකැස්ම කොතෙක් දුරට බලපාන්නේද යන්න හඳුනා ගන්න ලදී. එමෙන්ම එලෙස කාන්තාවන් පොදු අවකාශය තුළ අතවරයට ලක්වීම පුද්ගල අනන්‍යතාවටත්, සමාජ අනන්‍යතාවටත් සෘණාත්මකව බලපෑම් කෙරේ. එම සෑම බලපෑමක්ම කාන්තාවන්ගේ අනන්‍යතා මත වෙනස්ව සිදුවන ආකාරය මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. කෙසේ වෙතත් අවසාන වශයෙන් කාන්තාවන් පොදු අවකාශය තුළ ලිංගික අතවරයට ලක්වීම බහුතර කාන්තාවන්ගේ අනන්‍යතාවන්ට නිෂේධනාත්මක ලෙස බලපා තිබූ අතර ඉන් කිහිපදෙනෙකු සඳහා එය සාමාන්‍ය තත්වයක් විය. මේ ආකාරයෙන් පොදු අවකාශය තුළ කාන්තාවන් අතවරයට ලක්වීම සඳහා අවකාශයෙහි සැකැස්ම ද මූලිකවම බලපාන බව අනාවරණය විය.

*මුඛ්‍ය පද: කාන්තාව, ලිංගික අතවර, පොදු අවකාශය, අනන්‍යතාව, පොදු ප්‍රවාහන සේවය*